# Percutaneous Endoscopic Gastrostomy නළය (PEG නළය)

Percutaneous Endoscopic Gastrostomy (PEG) නලය, මුඛයෙන් ආහාර ගත නොහැකි අය සඳහා දියර ආහාර සහ ඖෂධ කෙලින්ම ආමාශයට ලබා දීමට භාවිතා වේ

PEG නලයක කොටස් හඳුනා ගනිමු




## PEG නළය රැකබලා ගන්නේ කෙසේද

### පළමු සතිය තුළ තුවාලය පිරිසිදු කිරීම

- තුවාලයේ ප්‍රදේශය දිනපතා ජලය (නටවා නිවා ගත්) හෝ 0.9% saline යොදා පිරිසිදු කරන්න.
- පිරිසිදු රෙදි / ගෝස් කැබැල්ලකින් හොඳින් වියළන්න.
- සම සහ බාහිර බම්පර් (External bumper) අතර ගෝස් කෑල්ලක් තබා ගන්න. තුනී ගෝස් කෑල්ලක් භාවිතා කරන්න. ඔබ විශාල ගෝස් කෑල්ලක් භාවිතා කරන්නේ නම්, තුවාලය මත අධික පීඩනයක් ඇති වේ.
- අධික වේදනාවක්, රතු පැහැයක්, සැරව පිටවීමක් හෝ උණ ඇත්නම් වෛද්‍ය උපදෙස් ලබා ගන්න.

### පළමු සතියෙන් පසුව තුවාලය පිරිසිදු කිරීම

- තුවාලය සුව වී ඇත්නම්, ඔබට සුපුරුදු පරිදි ස්නානය කළ හැකිය, මෘදු සබන් භාවිතා කිරීම වඩා හොඳය.
- සේදීමෙන් පසු හොඳින් වියළන්න.
- නලය ඇතුලුවන ස්ථානයේ ගෝස් කෑල්ලක් තබා ගැනීමට අවශ්‍ය නොවේ.

### නලය කැරකැවීම

- දින හතකට පසු, නළය වටයක් කරකවන්න. මෙය දිනකට එක් වරක් කරන්න..
- දින හතකට පසු, බාහිර බම්පරය (External bumper) ලිහිල් කර, නළය සෙන්ටිමීටර 2-3 ක් ඇතුලට තල්ලු කර, එය නැවත මුල් තත්වයට අදින්න. ඉන්පසු බාහිර බම්පරය මුල් ස්ථානයට ගෙන එන්න. බාහිර බම්පරය ඕනෑවට වඩා තද නොකරන්න. අවම වශයෙන් සතියකට වරක්වත් මෙය කරන්න.

- පිරිසිදු කිරීම සහ කැරකැවීම අතරතුර, සෑම විටම නළය ස්ථාවර කරන්න. ඕනෑවට වඩා චලනය වීම සමේ විවරය අනවශ්‍ය ලෙස විශාල වීමට හේතු වේ.

## නලයේ බාහිර දිග සටහන් කර තබාගන්න

- නළය ඕනෑවට වඩා ඇතුලටගමන් කළ හැකිය. එය හඳුනා ගැනීම සඳහා, සම මට්ටමේ සෙන්ටිමීටර සලකුණ මතක තබා ගන්න. එය වෙනස් වී ඇත්දැයි දිනපතා පරීක්ෂා කරන්න.
- මෙම සෙන්ටිමීටර සලකුණු ටික කලකට පසුව මැකී යා හැක. එබැවින්, බාහිර බම්පර්යේ (External bumper) සිට Feeding port දක්වා නලයේ බාහිර දිග මැන තබා ගන්න.

## නළය හරහා ආහාර ලබා දීම

- නළය හරහා ආහාර ලබා දීමෙන් පසු අවම වශයෙන් පැය භාගයක්වත්, රෝගියා වාඩි කරවා/උඩු කය මදක් උස් කර තබාගන්න.
- ආහාර දීමට පෙර කලම්පය (clamp) නිදහස් කරන්න
- ආහාර දීමට පෙර සහ පසුව නළය හරහා වතුර ටිකක් දෙන්න (මිලි ලීටර් 30 ක් පමණ).
- සෙමින් කෑම දෙන්න. මේ සඳහා විනාඩි 15-20 ක් වැය කරන්න
- ආහාර ලබා දීමෙන් පසු කලම්පය නැවත දමන්න (External bumper සිට සෙන්ටිමීටර 5 ක් පමණ දුරින්)

## බටය හරහා ඖෂධ ලබා දීම

- ආහාර සමඟ ඖෂධ මිශ්‍ර නොකරන්න.
- සෑම ඖෂධයක්ම වෙන වෙනම ලබා දීම වඩා හොඳය.
- ඖෂධ ලබා දීමට පෙර සහ පසු ජලය මිලි ලීටර් 30 ක් පමණ නළය හරහා දෙන්න.
- එක් ඖෂධයක් දෙන්න, ඊට පසුව වතුර ටිකක් දෙන්න. ඉන් පසුව ඊළඟ බෙහෙත දෙන්න.

## නළය අවහිර වී ඇත්නම් කුමක් කළ යුතුද?

- ඇල්මැරුණු ජලය ටිකක්, මිලි ලීටර් 60 ප්‍රමාණයේ සිරින්ජයකට ගෙන නලයට සම්බන්ධ කරන්න. සිරින්ජරයේ පිටුපස කොටස ඇතුළට සහ පිටතට තල්ලු කරන්න. වැඩි පීඩනයක් යොදන්න එපා.
- ඔබේ මාපටැඟිල්ල සහ දඹරඇඟිල්ලෙන් නළය තද කර බලන්න.
- තවදුරටත් අවහිරතාව පවතී නම්, වෛද්‍ය උපදෙස් ගන්න

**නළය අහම්බෙන් ඉවත් වීමකදී**

- පිරිසිදු රෙදි කැබැල්ලකින් / ගෝස් කැබැල්ලකින් උදරයේ සිදුර ආවරණය කරගෙන වහාම වෛද්‍ය උපදෙස් සදහා යන්න.

වෛද්‍ය හසිතා දමයන්ති